විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය**

# මධ්‍යගත වායුසමීකරණ පද්ධතිය ගලවා ඉවත් කිරීම සහ ගලවා ඉවත් කරන ලද යකඩ ගේට්ටු විකිණීම සඳහා මිල ගණන් කැඳවීම

ඔරුගොඩවත්ත, බේස්ලයින් පාර අංක 60/460 දරණ ස්ථානයෙහි පිහිටි ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය නව කැලණි පාලම ව්‍යාපෘතිය හේතුවෙන් වෙනත් ස්ථානයක ස්ථාපනය කරනු ලබන හෙයින් පහත සඳහන් අයිතම විකිණීම සඳහා පිළිගත් ආයතන හෝ පුද්ගලයින් වෙතින් මුද්‍රා තැබූ මිල ගණන් කැඳවනු ලැබේ.

1. ක්‍රියාත්මක තත්ත්වයේ පවතින මධ්‍ය වායු සමීකරණ පද්ධතිය සම්පූර්ණයෙන් ගලවා ඉවත් කොට මිලදී ගැනීම
2. භාවිතයෙන් ගලවා ඉවත් කරන ලද ප්‍රධාන යකඩ ගේට්ටු විකිණීම

මේ පිළිබඳ උනන්දුවක් දක්වන අය ඉහත ලිපිනය වෙත පැමිණ ස්ථානීය පරීක්ෂාවක් 2017.08.24 දින සිට 2017.08.31 දින දක්වා රාජකාරී දිනවල දී පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා සිදු කළ හැකිය. වැඩි විස්තර අධ්‍යක්ෂ (පරිපාලන) වෙතින් විමසිය හැකිය.

ඔබගේ මිල ගණන්, "මුල් පිටපත" හා "අනු පිටපත" ලෙස සඳහන් කර, වෙන වෙන ම කවර වල බහා මුද්‍රා තබා 2017.09.04 දින පස්වරු 2.00 ට හෝ ඊට පෙර භාරදිය යුතුය. මිල ගණන් විවෘත කිරීම 2017.09.04 දින පස්වරු 2.00ට සිදු කෙරේ. නියමිත වේලාවට පසු ලැබෙන ලංසු පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු විවෘත කිරීම, ලංසුකරු හෝ ඔහුගේ නියෝජිතයන් ඉදිරියේ, ලංසු භාර ගැනීම අවසන් වූ වහාම සිදුකරනු ලැබේ. රු.5,000/= ක ආපසු ගෙවනු ලබන ලංසු තැන්පතු මුදලක් අය කරනු ලැබේ.

වැඩිම මිල ඉදිරිපත් කරනු ලබන අය විසින් ආයතනය මගින් ඒ බව දැනුම් දී දින 7 ක් ඇතුලත අදාල භාණ්ඩ ආයතන භූමියෙන් ඉවත් කර ගත යුතුය.

මිල ගණන් ඉදිරිපත් කිරීමේ පත්‍රිකාව හා අදාල විස්තර ආයතනයේ වෙබ් අඩවියෙන් (www.aeb.gov.lk) පරීක්ෂා කළ හැකිය. මිලගණන් ඉදිරිපත් කිරීමේ පත්‍රිකාව හා අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයේ පිහිටි ප්‍රසම්පාදන අංශයෙන් මිල ගණන් පත්‍රිකා ලබා ගත හැකිය.

ලංසු පත් භාර ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය සතු වේ.

**සභාපති**
**ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය**
**60/460 , බේස්ලයින් පාර**
**ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය**

**දුරකථන : 0112 533427 දිගුව 258**
**ෆැක්ස් : 0112 533448**